# සාර්ක් සහ දකුණු ආසියානු භූ දේශපාලනය

දකුණු ආසියානු සහයෝගීතාව කොළඹ ග්ලෙනි වීදියේ අඩු ආදායම්ලාභීන්ගේ 'අනවසර ගේ දොර' විසුණු කොට පැතිර යමින් තිබේ. අධිකරණ වාරණ නියෝගය ''පමා නොවී ලැබුණේ නම්'' නීති ගරුක පොලීසිය සහ නාගරික සංවර්ධන අධිකාරිය මේ සා මහත් විනාශයකට මුල පුරන්නට ඉඩ නොතිබිණ. කෙසේ වුවද සියල්ල අවසානයේ දකුණු ආසියාතික රාජ්‍ය නායකයින්ට දූන් සිත් සැනසිල්ලේ කොළඹට සම්ප්‍රාප්ත විය හැක. මන්ද යත්, ග්ලෙනි වීදියෙන් මතුවන්නට ඉඩ තිබූ 'භයානක තර්ජනය' බිමටම සමතලා කොට දමනු ලැබ ඇති හෙයිනි.

කොළඹ සිට ක්‍රියාත්මක වන *Groundviews* වෙබ් අඩවියට ජූලි 18 වෙනිදා රුවන්මිණී වික්‍රමසිංහ විසින් ලියන ලද ලිපියකට අනුව 'සාර්ක් සමුළුව මඟහැර සිටීමට රිසිවුන්ට විදේශගත නිවාඩුවක් රුපියල් 38,000 සිට 70,000 දක්වා ගණනකට ලබාගැනීමේ අවස්ථාව' දූන් මාධ්‍ය වෙළඳ දැන්වීම් හරහා ප්‍රදානය කර තිබේ. කොළඹ ආරක්ෂාව සඳහා නිවාඩුවක් ගෙන රට හැර යාමට වත් පොහොසත්කම් නොමැති ජනයාට දූන් ගේ දොරට වී ශ්‍රී ලංකාව සහ සංචාරක ඉන්දියානු පිළ අතර ටෙස්ට් තරඟාවලිය නැරඹීමේ විකල්පය තෝරා ගැනීමට හැක.

එළඹෙන සාර්ක් සමුළුව දකුණු ආසියාතික රාජ්‍යයන් අතර අන්තර් සහයෝගීතාව සහ කලාපීය භූ දේශපාලන යථාර්ථයන් කෙරෙහි කවර බලපෑමක් එල්ල කරනු ඇතිද? මේ ප්‍රශ්නය කොළඹ ජනමාධ්‍ය සාකච්ඡාවන්ට වැදගැම්මකට නැති ආගන්තුක එකකි. සීමිත ඕවර තරඟයක් තරමට මහජන ආතතිය ඉහළ නංවා ඇති 'වන්නි මෙහෙයුම' පිළිබඳ දෛනික සංත්‍රාසය නිෂ්පාදනය කරනු විනා අන් කිසිවක් ජනමාධ්‍යයට වැදගත් වන බවක් නොපෙනේ.

### ආර්ථික සහයෝගීතාවද? දේශපාලන කේවල් කිරීමද?

වැදගත් යැයි සළකා ඉහතින් මතුකරනු ලැබූ ප්‍රශ්නයට පූර්විකාවක් සේ සැළකිය හැකි ඉතිහාස විස්තරයක් තිබේ.

සාර්ක් සංවිධානය පිළිබඳ අදහස ගැන '80 දශකය මුල් භාගයේ බංග්ලාදේශ ජනාධිපති ධූරය දැරූ ජෙනරාල් සියා උර් රහමන් විසින් පළමුවෙන් ඉඟි කරන ලද්දේ 1980 මැයි මාසයේදී ය. නමුත් එය ප්‍රායෝගිකත්වයට නැංවූ පළමුවැන්නා ජෙනරාල් රහුමාන්ගේ ප්‍රචණ්ඩ අනුප්‍රාප්තිකයා වූ ජෙනරාල් මොහොමද් එර්ෂාද් වීම අහඹුවක් සේ සැළකිය හැකිය. 1985දී බංග්ලාදේශයේ ඪකා අගනුවරින් ශ්‍රී ලංකාවද ඇතුළත් දකුණු ආසියාතික රාජ්‍ය හතරක කලාපීය සන්ධානයක් වශයෙන් සාර්ක් සංවිධානය දියත් කෙරෙන විට දකුණු ආසියාවේ දළ දේශීය නිෂ්පාදිතයෙන් වැඩි පංගුවකට හිමිකම් කියන ලද්දේ මෙම රාජ්‍යයන් හතර විසිනි.

නිරවි යුද සමයේ දකුණු ආසියාව තුළ පැවති බලතුලනයන්ගේ සන්දර්භය තුළ සාර්ක් සංවිධානයේ බිහිවීම භූ දේශපාලන සංකීර්ණතාවන් හඟවනු ලැබිණ. උදාහරණයක් වශයෙන් ගිණිකොන දිග ආසියාතික රාජ්‍යයන්ගේ සන්ධානයක් වශයෙන් බිහි වූ 'ආසියාන් සංවිධානය' බලමුළු ගැන්වීම මූලික වශයෙන් ඇමරිකා එක්සත් ජනපදයේ සක්‍රීය දායකත්වයෙන් සිදුවූවකි. එය බැඳී තිබුණේ ගිණිකොන දිග ආසියානු කලාපය තුළ එක්සත් ජනපද භූ දේශපාලන උපාය මාර්ගික අභිලාෂයන් සමගිනි. නමුත් සාර්ක් සංවිධානයේ යථාර්ථය ඊට පටහැනි එකක් විය. හේතුව මෙයයිඃ දකුණු ආසියාවට ඉන්දියාව නමැති කලාපීය ගුරුත්ව කේන්ද්‍රයක් තිබිණ. නිරවි යුද්ධයේ සෝවියට් කඳවුරට හිතවත් ස්ථාවරයක පිහිටා සිටි ඉන්දියාවේ දෘෂ්ටි කෝණයෙන් සාර්ක් සමුළුවට අත්‍යවශ්‍ය වැදගත්කමක් නොතිබිණ. ඊට හේතුව ආර්ථික සහයෝගීතාවයේ බැනරය පෙරටු කොටගෙන ඒකරාශී වුවද, කලාපීය රාජ්‍යයන්ගේ එකතුවක දේශපාලන ඉලක්කය තමන් වනු ඇතැයි සිතීමට අවශ්‍ය පමණටත් වඩා හේතු ඉන්දියාවට තිබීමයි. එක්සත් ජනපදය කෙරෙහි සක්‍රීය පක්ෂපාතීත්වයක් පෙන් වූ ජෙනරාල් සියා උල් හක්ගේ පාකිස්ථානය සහ ජයවර්ධනගේ ශ්‍රී ලංකාවත් සමග වූ ඉන්දියාවේ රාජ්‍ය තාන්ත්‍රික සබඳතා ඒ වනවිටත් බරපතල ලෙස පලුදු වී තිබිණ. එමෙන්ම පශ්චාත් මුජිබුර් රහුමාන් සමයේ බංග්ලාදේශ - ඉන්දියානු සබඳතාවන්ගේ ස්වභාවයද නිරන්තර ආතතීන් සහිත එකක් විය. මේ හේතුන් මත කලාපීය සහයෝගීතාවයේ නාමයෙන් බංග්ලාදේශයෙන් යෝජනා වූ සාර්ක් සංකල්පය තමන් හා දේශපාලන කේවල් කිරීමට අවශ්‍ය වූ සාමූහික බලයක් අවශේෂ රාජ්‍යයන් තුනට සපයා දෙනු ඇතැයි ඉන්දියාව කල්පනා කළාට සැක නැත. ආර්ථික සහයෝගීතාව පිළිබඳ උද්‍යෝග පාඨයන්ට යටින් තම කලාපීය දේශපාලන අධිකාරය සීමා කිරීමේ උපායික සැළැස්මක් සාර්ක් සංකල්පය පිටුපසින් ඇතැයි සිතන්නට සෑම හේතුවක්ම ඉන්දියාව හමුවේ තිබිණ.

එහෙත් ඉන්දියාව බැහැර කොට ගොඩනැගෙන කලාපීය සන්ධානයක් යථාර්ථයක් කොට සැළකීමට ඉන්දියාව තරමටම අවශේෂ රාජ්‍යයන්ටද පුළුවන්කමක් නොතිබිණ. සෝවියට් පිටුබලය ලැබූ තෙවැනි ලොව සහයෝගීතාවට නැඹුරු තම විදේශ පිළිවෙතට පටහැනිව යමින් දකුණු ආසියාතික රාජ්‍යයන් අතර යෝජිත සහයෝගීතාවකට අඩයක් වීමට නොහැකි මූලධාර්මික හේතූන්ද ඉන්දියාව හමුවේ පැවතුණි. මේ පසුබිම තුළ සාර්ක් සංවිධානයේ බිහිවීම, පරස්පර අභිලාෂයන් හා රාජ්‍යයන් අතර වර්ධනය වෙමින් තිබූ ආතතීන්ම, කලාපීය එකාබද්ධතාව සඳහා වූ පොදු සාධකයක් බවට පෙරළීමේ ප්‍රතිඵලයක් වශයෙන් සැළකිය හැකිය.

### ප්‍රගතිය පිළිබඳ අඳුරු යථාර්ථයන්

දැන් ඉන්දීය උප මහාද්වීපික කලාපයෙන් බැහැර ඇෆ්ඝනිස්ථානයද ඇතුළු රාජ්‍යයන් 8ක් දක්වා සාර්ක් සංවිධානය පුළුල්ව තිබේ. නමුත් ඉකුත් වසරේ පැවැත්වුණු 14 වෙනි සාර්ක් සමුළු වාරය වන විටත් ප්‍රකාශිත ආර්ථික සහයෝගීතාවන් පිළිබඳව ප්‍රගති වාර්තාවක් පෙන්වීමට සාර්ක් සංවිධානය සමත්ව නැත. 2003 වන විටත් දකුණු ආසියානු ආර්ථිකයන් අතරේ පමණක් සිදු කෙරුණු අපනයන වෙළඳ ගණුදෙනුවල ප්‍රමාණය ප්‍රතිශතයක් වශයෙන් සැළකූ විට එය 4.5%ක් තරම් සුළු එකකි. කලාපයේ විශාලතම ආර්ථිකයන් සේ සැළකෙන ඉන්දියාව සහ පාකිස්ථානය පමණක් ගෙන සැළකුවද, 2006 අවුරුද්ද වන විට දෙරට අතර සිදුවූ ද්වීපාර්ශ්වික වෙළඳ ගණුදෙනුවල වාර්ෂික වටිනාකම ඩොලර් මිලියන 300 ඉක්මවා නොතිබිණ. ඩොලර් බිලියන 200ක් තරම් වූ දෙරටෙහි වාර්ෂික වෙළඳාමේ සමස්ත අගයට සාපේක්ෂව සැළකූ විට මිලියන 300ක ද්වීපාර්ශ්වික ගණුදෙනු වනාහී නොවැදගත් තරමේ කුඩා පංගුවකි. ***(Sujata Jhamb** - "India's Regional Trading Agreements" /South Asian Journal - March 2006)*

අන්‍යෝන්‍ය සහයෝගීතාවයේ රෝගී ප්‍රගතිය පිළිබඳ තවත් සාක්ෂි එමටය. සාර්ක් රටවල් විසින් අත්පත් කරගනු ලැබ ඇති සමාජ සංවර්ධනයට අදාළ ඉලක්කම් ඊට මනා නිදසුනකි. දකුණු ආසියාව ලෝක ජනගහණයෙන් හතරෙන් එකක් හෙවත් බිලියන 1.4ක ජනගහණයක් සහිත වන නමුත් ලෝක දළ දේශීය නිෂ්පාදිතයට කලාපය දක්වන දායකත්වය 2%ක් ඉක්මවා

නොයයි. *(http://web.worldbank.org/WBSITE/EXTERNAL/COUNTRIES/SOUTHASIA)* ලොව දරුණුම ඌණ පෝෂණ කලාපය සේ සැළකෙන දකුණු ආසියාවේ ළමා ජනගහනණයෙන් හරි අඩක් අඩු බරින් යුතු ය. ලෝක බැංකුවේ සාඩම්බර හෙළිදරව් කිරීම්වලට අනුව බැලුවද, සෞඛ්‍ය, පානීය ජල හා සනීපාරක්ෂක පහසුකම් අතින් අඳුරුම යථාර්ථයන් විදහා පෙන්වනුයේ සාර්ක් කලාපයයි. අනෙක් අතින් දකුණු ආසියාව ලෝකයේ වඩාත්ම මිලිටරීකරණය වූ භූ දේශපාලන කලාපය වශයෙන් සැළකේ. කලාපයේ දළ දේශීය නිෂ්පාදිතයෙන් ඉහළම ප්‍රතිශතයක් වැයවන්නේ ආරක්ෂක වැය සඳහා වන අතර 2006 අවුරුද්දේ ඩොලර් බිලියන 190ක් වූ සාර්ක් රටවල ඒකාබද්ධ අයවැයෙන්, බිලියන 28ක් හෙවත් 15%ක්ම වෙන්වූයේ ආරක්ෂාව හා බැඳුණු විදයම් සඳහාය. *(ආරක්ෂක වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් වශයෙන් ගෙන සැළකූ විට ශ්‍රී ලංකාව සිටින්නේ දකුණු ආසියාවේත් පළමු ස්ථානයේ බව මතක තබාගැනීම ලාංකිකයන්ට වැදගත් ය.)*

1997 මාලේ සමුළු වාරයේදී ඇතිකරගත් එකඟතා ප්‍රකාරව සාර්ක් රටවල් විසින් අත්පත් කරගනු ලැබ ඇති සමාජ - ආර්ථික වර්ධනයන් සමාලෝචනය කිරීමට විද්වත් කමිටුවක් පත් කෙරිණ. කමිටුව විසින් සිය කාර්යය අවසන් කරමින් නිකුත් කළ වාර්තාව *(SAARC Vision Beyond The Year 2000)* ඉහත කී අඳුරු චිත්‍රයේ ගැඹුර පෙන්වන කදිම නිදසුනකි. අදාළ වාර්තාවට අනුව මිලියන 960ක් වූ ඉන්දීය ජනගහණයෙන් මිලියන 400ක් ජීවත් වන්නේ දරිද්‍රතා රේඛාවට පහළිනි. ජනගහණයෙන් 48%ක් සාක්ෂරතාවට හිමිකම් නොකියයි. අවුරුදු පහට අඩු ළමුන්ගෙන් 53%ක් මන්ද පෝෂණයෙන් පෙළෙයි. පාකිස්ථානයේ ජනගහණයෙන් 62.2%ක් ලිවීමේ - කියවීමේ හැකියාවෙන් තොර අතර, ආයු අපේක්ෂාව 58කි. බංග්ලාදේශයේ ශ්‍රම හමුදාවෙන් 35.6%ක් විරැකියාවෙන් පෙළෙන අතර වාර්ෂිකව 200,000ක ස්ත්‍රීන් හා ළමුන් වහල් සහ ලිංගික ශ්‍රමිකයින් වශයෙන් රටින් බැහැරට විකිණේ. නේපාලයේ දරිද්‍රතා රේඛාවට පහළින් ජීවත්වන ප්‍රමාණය ජනගහණයෙන් 60%කි. ජනයාගෙන් 72.5%ක් සාක්ෂරතාවෙන් තොරය. භූතානයේ ආයු අපේක්ෂාව 52ක් වන අතර ඒක පුද්ගල ආදායම ඩොලර් 73කි. ශ්‍රී ලංකාවේ තත්ත්වය පිළිබඳ විශේෂයෙන් කිව මනා නොවේ. ලොව වැඩිම දිවි නසා ගැනීමේ අනුපාතය සහිත ලංකාවේ හරි අඩකට ආසන්න ප්‍රමාණයක් උපයන්නේ ඩොලර් 2කට අඩුවෙනි. ගැබිනි මව්වරුන්ගෙන් හතරෙන් එකක් නිරක්තියෙන් පෙළෙන අතර අවුරුදු පහට අඩු ළමුන්ගෙන් 60%ක් කවර හෝ තත්ත්වයක ඌන පෝෂණ තත්ත්වකින් පෙළේ. බැලූ බැල්මට ඉහළ ඒක පුද්ගල ආදායමක් සහිත කුඩා ආර්ථිකයක් වන මාලදිවයින පවා ප්‍රජාතාන්ත්‍රික ව්‍යුහයන් හකුළා දමූ තනි පක්ෂ ඒකාධිකාරයකට යටව තිබේ.

කලාපීය සහයෝගීතාව විසින් විසි වසරක් තුළ උපයා දුන් ප්‍රගතිය පිළිබඳ යථාර්ථය මෙය නම් සාර්ක් සංවිධානය කුමක් සඳහාද?

## දකුණු ආසියානු කලාපීයවාදය පිළිබඳ මිථ්‍යාව

ඇත්තෙන්ම නම් නිරවි යුද්ධයෙන් පසු ලෝක සන්දර්භය තුළ සාර්ක් සංවිධානය මූලික වශයෙන් පරාවර්ථනය කරන්නේ අභිලාෂයන් දෙකකි. පළමුවැන්න මධ්‍යම ආසියාවේත්, පර්ෂියානු ගල්ෆ් කලාපයේත්, නැගෙනහිර අප්‍රිකාවේත් එක්සත් ජනපදය මුල් කොටගත් අධිරාජ්‍යවාදී යුද සන්ධානය විසින් උත්සන්න කෙරෙන ක්‍රියාකාරීත්වයන්ට පිටුබල සපයන පිනුම් පිත්තක් බවට දකුණු ආසියානු රාජ්‍යයන් පත්කර ගැනීමේ එක්සත් ජනපද අභිලාෂයයි. දෙවැන්න, චීනය සහ ඉන්දියාව අතර තීව්‍ර වන කලාපීය යුද හා ආර්ථික බල තරඟයේ ආතතීන් කළමනාකරණය කරගැනීමේ ඉන්දීය අභිලාෂයයි.

2006 අප්‍රේල් මාසයේදී ඩකා නුවරට රැස් වූ සාර්ක් නියෝජිතයන්ගේ ස්ථාවර කමිටුව විසින් එක්සත් ජනපදය සහ දකුණු කොරියාවට 'නිරීක්ෂක සහභාගීත්වය' සඳහා අවසරය ලබාදීමට තීන්දු කිරීම බැඳී ඇත්තේ මින් පළමුවැනි කරුණ සමගය. 2005 නොවැම්බර් සමුළු වාරයේදී චීනයට සහ ජපානයට නිරීක්ෂක සහභාගීත්වය පිරිනැමීමට ගත් තීරණය සමගද, නිරීක්ෂක සහභාගීත්වයට අවසරය ඉල්ලා සිටින අයදුම් පත්‍රයක් ඉරානය විසින් 2007 මාර්තුවේදී ඉදිරිපත් කිරීමට උනන්දු වීමද පළමු කරුණ හා බැඳී පවතී.

අනෙක් අතින් කලාපය තුළ වර්ධනය වන චීනයේ මැදිහත්වීම් හමුවේ වැඩිවන ඉන්දියානු කණස්සල්ලට පිළියම් සෙවීමේ යාන්ත්‍රණයක් වශයෙන්ද සාර්ක් සංවිධානයේ වැදගත්කම ඉහළ යමින් තිබේ. බංග්ලාදේශයේ චිතගොං නාවුක වරායේත්, අරාබි මුහුදට යාබද පාකිස්ථානයේ ග්වාදර් වරායේත්, ඉන්දීය සගරය හරහා දිවෙන වැදගත්ම සන්නිවේදනය මුහුදු මාර්ගයන්ට විවර වූ ශ්‍රී ලංකාවේ හම්බන්තොට වරායේත් සංවර්ධන සැළසුම් චීනය අත්පත් කරගැනීම ඉන්දියාවේ කලාපීය අධිකාරය බලවත් ලෙස තර්ජනයට ලක්කොට තිබේ. මෙය, ඉන්දියාවට අයත් නිකොබාර් සහ අන්දමන් දූපත්වලට යාබද මියන්මාරයේ මහා කොකෝ දිවයින් සහ මාලදිවයිනේ මරාවෝ දිවයිනත් ආශ්‍රිත චීන උපායික ක්‍රියාකාරකම් විසින් කලින් සිට ඇතිකොට තිබූ ආතතියට අමතර වශයෙනි. ඉන්දියාවේ බටහිර බල ප්‍රදේශයන්ගේ සිට නැගෙනහිර අප්‍රිකාව දක්වාම සියුම්ව වර්ධනය වන චීනයේ වෙළඳ හා උපායික ව්‍යාප්තවාදය, එක්සත් ජනපද අනුමැතිය සහිත ඉන්දීය ව්‍යාප්තවාදයක් මගින් තුලනය කරගැනීමේ අවශ්‍යතාව අන් කවරදාටත් වඩා අද ඉන්දියානු පාලක පංතීන්ට අවශ්‍යව ඇත්තේ එහෙයිනි.

මේ සමස්ත හා සංකීර්ණ රූපය විසින් පෙන්නුම් කරන්නේ කුමක්ද? එය පෙන්නුම් කරන්නේ වර්ධනය වන ගෝලීය සහ කලාපීය භූ දේශපාලන ආතතීන් අදාළ බලවතුන්ට අවශ්‍ය පරිදි කළමනාකරණය කරගැනීමේ මෙවලමක් වශයෙන් විනා අන් වැදගත් කාර්යයක් සාර්ක් සංවිධානයට පැවරී නැති බවයි. සාර්ක් කලාපය තුළ ඇතිකරගන්නා සම්මුතීන්ට වඩා ආර්ථික වශයෙන් ඵලදායී වන්නේ වෙනත් කලාපීය එකතුන් සමග වර්ධනය වන සබඳතා බව ඉන්දියාව සහ පාකිස්ථානය දැනටමත් අවබෝධ කරගෙන තිබේ. නිදසුන් ඕනෑ තරම් ය. ලාඕසය, කාම්බෝජය, මියන්මාරය, තායිලන්තය සහ වියට්නාමය සමග නව සබඳතාවන්ට මුල පුරමින් ඉන්දියාව විසින් 2000දී දියත් කළ මීකොන්ග් - ගංගා සහයෝගිතා සංවිධානය වූ කලී චීනයේ බටහිර බල සීමාවට ඉන්දියාවේ ඇතුල් වීම සළකුණු කිරීමකි. අනෙක් අතින් ආසියාන් සහ ආසියා පැසිෆික් ආර්ථික සහයෝගිතා සංවිධානයට *(APEC)* ඉන්දියාව ඇතුළත් කරගැනීමට ජපානය සිය නොමසුරු සහාය පිරිනමනු ලැබිණ. 2005 වන විට ඉන්දියාව සහ ආසියාන් සාමාජික රටවල් අතර වෙළඳ ගණුදෙනු ඩොලර් බිලියන 18ත් ඉක්වා ඉහළ යාමේ පසුබිම එයයි. තම බල ප්‍රදේශයන් කරා වර්ධනය වන ඉන්දීය කා වැදීම්වලට ප්‍රතිචාර වශයෙන් ඉන්දියාවේ බල ප්‍රදේශයන් වන දකුණු සහ මධ්‍යම ආසියාව දෙසට චීනය වඩ වඩාත් ඇතුළු වෙමින් සිටියි. 1996දී ඩොලර් බිලියන 2.3ක මට්ටමේ තිබූ චීන-දකුණු ආසියානු වෙළඳ ගණුදෙනු 2005 වන විට ඩොලර් බිලියන 25 දක්වා දහ ගුණයකින් ඉහළ නැගීමක් වාර්තා කළේය. අනෙක් අතින් මධ්‍යම ආසියාව තුළ සිය තත්ත්වය තහවුරු කර ගැනීමට රුසියාව සහ කැස්පියානු රාජ්‍යයන් සමඟ එක්ව 2001දී ආරම්භ කළ ෂැංහයි සහයෝගිතා සංවිධානය *(SCO)* ආරම්භ කළ චීනය, ඉන්දියාවේ ඓතිහාසික පසමිතුරා වන පාකිස්ථානය ඊට එක්කර ගැනීමටද පූර්ණ අනුබල සැපයුවේය. පසුගිය අවුරුද්ද වන විට ඇෆ්ඝනිස්ථානය සාර්ක් සංවිධානයට ඇතුළත් කරගැනීමට ඉන්දියාව දක් වූ උනන්දුව තේරුම්ගත හැක්කේ මේ පසුබිම තුළය.

ඇත්තෙන්ම සාර්ක් සංවිධානය හරහා තොරොම්බල් කරන දකුණු ආසියානු කලාපීයවාදය ව්‍යාජයක් වන්නේ සාර්ක් සන්ධානයේ කිසිදු රාජ්‍යයක් එවැනි ශක්තිමත් කලාපීයවාදයක් ගොඩනැංවීමට අවශ්‍ය ස්වාධීනත්වයක් නොපෙන්වන බැවිනි. ඓතිහාසිකව එවැනි විභවයක් තිබුණේ නම් එය හිමිව තිබුණේ ඉන්දියාවට ය. නමුත් ඉන්දියාව සහ එක්සත් ජනපදය අතර සවිමත් වන සබඳතාවන් හරහා ඉන්දීය පාලක පන්තිය එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ කණිෂ්ඨ කලාපීය හවුල්කරුවා බවට පත්වීමේ ප්‍රතිඵලය වන්නේ එකී ඓතිහාසික විභවයද සහමුලින්ම අහෝසි වී යාම වේගවත් කිරීමයි.

මේ අනුව ජූලි 27 වෙනිදා සිට කොළඹ දී මුළුදීමට නියමිත සාර්ක් සංවිධානයේ 15 වෙනි සමුළුවාරය, කලාපීය සහ ගෝලීය භූ දේශපාලන අභිලාෂයන්ගේ ආවෘත යුද්ධය පෙරට ගෙනයනු හැරෙන්නට ස්වාධීන හා ඵලදායී කලාපීය සහයෝගිතාවක් සඳහා වූ මාවතක් විවර නොකරනු ඇත. රුපියල් බිලියන 2.18ක් වැය කොට ලංකාවට සාර්ක් සැණකෙලිය කැඳවාගෙන ඒමේ වාසිය ශ්‍රී ලංකා රජය විසින් භුක්ති විඳිනු ඇත්තේ ලංකාවේ ජනවාර්ගික ගැටළුව කෙරෙහි වන සිය යුදවාදී ස්ථාවරයට අවශ්‍ය සහනශීලී අනුමැතිය කලාපීය රාජ්‍යයන්ගෙන් සපයාගැනීමට සැළසුම් කිරීමෙනි.

**නවීරත්**

*"සියත" - 2008 ජූලි 27*